සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

25B | S | I

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................

යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

## I කොටස

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01. 1. හඩ්සන් 2. පෝ 3. රෝන් 4. එල්බ් 5. විස්ටුලා (.....)

02. 1. පිරනීස් 2. අසොව් 3. කාර්පේතියන් 4. ඇපනයින් 5. යූරල් (.....)

03. 1. ඇටිකා 2. මිලේටස් 3. මැරතන් 4. සමෝස් 5. කාර්තේජය (.....)

04. 1. කොන්ස්ටන්ටයින් 2. VII වන හෙන්රි රජු 3. චාලිමේන් අධිරාජ්‍යයා 4. ක්ලෝඩියස් රජු 5. තියඩෝසියස් අධිරාජ්‍යය (.....)

05. 1. XIV වන ලුවී රජු 2. XV වන ලුවී 3. XVI වන ලුවී 4. XVII වන ලුවී 5. XVIII වන ලුවී (.....)

06. 1. ඒබ්‍රහම් ඩර්බි 2. ජේම්ස් වොට් 3. විලියම් හාර්වේ 4. හම්ප්‍රිඩේවි 5. සැමුවෙල් ක්‍රොම්ටන් (.....)

07. 1. මෙටර්නික් 2. කාසල්රි 3. ඇලෙක්සැන්ඩර් සාර් 4. තෝමස් හොබ්ස් 5. ෆෙඩ්රික් විලියම් (.....)

08. 1. ට්‍රොපව් සම්මේලනය 2. අයිලා චැපෙල් සම්මේලනය 3. වෙරෝනා සම්මේලනය 4. ලයිබැක් සම්මේලනය 5. බර්ලින් සම්මේලනය (.....)

09. 1. නයිල් සටන 2. ට්‍රැෆර්ගාර් සටන 3. සෙඩාන් සටන 4. වෝටර්ලු සටන 5. ඔස්ටර්ලිට්ස් සටන (.....)

10. 1. කාසල්රි 2. මෙටර්නික් 3. ටැලිරැන්ඩ් 4. බිස්මාර්ක් 5. සාර් ඇලෙක්සැන්ඩර් (.....)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැලපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

11.
1. සියුස් - අහසට අධිපති
2. සෙරෙස් - අස්වැන්නට අධිපති
3. වීනස් - ආලයට අධිපති
4. ජුපිටර් - අහසට අධිපති
5. මාර්ස් - ප්‍රඥාවට අධිපති (.....)

12.
1. ජර්මනිය - ඇලෙක්සැන්ඩර්
2. ස්පාඤ්ඤය - ෆර්ඩිනන්ඩ් ඉසබෙලා යුවල
3. ප්‍රංශය - IV වන හෙන්රි
4. පෘතුගාලය - නාවික හෙන්රි
5. එංගලන්තය - VII වන හෙන්රි (.....)

13.
1. පෘතුගාලය - ලිස්බන්
2. ස්පාඤ්ඤය - මැඩ්රිඩ්
3. ඔස්ට්‍රියාව - බර්ලින්
4. ප්‍රංශය - පැරිස්
5. එංගලන්තය - ලන්ඩන් (.....)

14.
1. සාප්පුකාර ජාතිය - එංගලන්තය
2. භූගෝලීය පදයක් පමණි - ඉතාලිය
3. යුරෝපයේ රෝගියා - තුර්කිය
4. අඳුරු මහද්වීපය - අප්‍රිකාව
5. හිරු නොබසින අධිරාජ්‍ය - ප්‍රංශය (.....)

15.
1. ප්‍රංශයේ ජාතික රාජ්‍යය - රිචලියූ
2. වියානා සමථය - මෙටර්නික්
3. අයි ලා චැපෙල් සම්මේලනය - පාමර්ස්ටන්
4. තරුණ ඉතාලිය - මැසිනි
5. බර්ලින් සම්මේලනය - බිස්මාර්ක් (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැලපෙන අනුපිළිවෙලට නොවේ. Y තීරුව X තීරුව සමඟ ගැලපෙන අනුපිළිවෙලට සකස්කල විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය තෝර ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පෙරික්ලීස් | A | ''අතීත අත්දැකීම් අනාගතයට ප්‍රයෝජනවත් විය හැකිය.'' |
| 2. | සොක්‍රටීස් | B | ''සෑම ද්‍රව්‍යයක්ම සංඝෘහිත වී ඇත්තේ චලනය වන පරමාණුවලින් බව'' |
| 3. | හිපොක්‍රටීස් | C | ''සත්‍ය ගවේෂකයෙකු'' ලෙස සැලකීම. |
| 4. | තුසිඩිඩීස් | D | ''ප්‍රශ්න කිරීමේ යුගය'' |
| 5. | ඩිමොක්‍රිටස් | E | ''සෑම රෝගයක්ම වැළදෙන්නේ ස්වභාවික හේතුවල ප්‍රතිඵලයක් නිසාය.'' |

1. BEACD 2. CEABD 3. DCEAB 4. DEACB 5. EDACB (.....)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | එට්‍රස්කන්වරු | A | රෝම රාජාණ්ඩුවේ අවසන් රජු |
| 2. | පැට්‍රිෂියන්වරු | B | රෝමය තුළ සමාජ දේශපාලන වරප්‍රසාද අඩු පිරිස |
| 3. | ටාර්ක්වින් | C | කාතේජ නගරයේ සිට රෝමයේ ආක්‍රමණය කිරීමට පැමිණි වෙළඳ පිරිස |
| 4. | ෆිනිෂියන්වරු | D | රෝම නගරයේත් ඉතාලියේත් තම බලය පතුරුවාගත් ගෝත්‍රයකි |
| 5. | ප්ලේබියන්වරු | E | සියලු දේශපාලන බලතල හිමි, සමාජයේ සිටි ධනවත් හා බලවත්ම පිරිස |

1. BEACD 2. CEABD 3. DCEAB 4. DEACB 5. EDACB (.....)

18. X / Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | හීම සමය | A | ඇමරිකන් නිදහස් සටන |
| 2. | කාබොනරි ව්‍යාපාරය | B | වියානා සම්මේලනය |
| 3. | ස්වාධීනතා පනත | C | ප්‍රංශ විප්ලවය |
| 4. | මෙටර්නික් ක්‍රමය | D | ආගමික ප්‍රතිසංස්කරණය |
| 5. | ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය | E | ඉතාලිය එක්සත් කිරීම |

1. BEACD 2. CEABD 3. DCEAB 4. DEACB 5. EDACB (.....)

19. X / Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | වෙස්ට්පේලියා සාම ගිවිසුම | A | ක්‍රි.ව. 1802 |
| 2. | කැප්පෝෆෝමියෝ ගිවිසුම | B | ක්‍රි.ව. 1866 |
| 3. | ඒමියන්ස් ගිවිසුම | C | ක්‍රි.ව. 1859 |
| 4. | විලාෆ්‍රැන්කා ගිවිසුම | D | ක්‍රි.ව. 1648 |
| 5. | ප්‍රාග් ගිවිසුම | E | ක්‍රි.ව. 1797 |

1. BEACD 2. CEABD 3. DCEAB 4. DEACB 5. EDACB (.....)

20. X / Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | කැල්වින්වාදීහු | A | එංගලන්තය |
| 2. | හියුගනෝවරු | B | ඕලන්දය |
| 3. | පියුරිටන්වරු | C | ස්කොට්ලන්තය |
| 4. | ප්‍රෙස්බිටීරියන්වරු | D | ස්විසර්ලන්තය |
| 5. | රෙපරමාදු පල්ලියේ සාමාජිකයෝ | E | ප්‍රංශය |

1. BEACD 2. CDEBA 3. BDEAC 4. EDABC 5. CDEBA (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරින් එකක් අදාළ මාතෘකාවට නොගැලපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. පුනරුද සමයට අයත් වැදගත් පුද්ගලයන්,
    1. ලියනාඩෝ ඩාවින්චි 2. මයිකල් සර්වෙටෙස් 3. බර්තොලමියුඩයස්
    4. තෝමස් නිව්කොමන් 5. මයිකල් ආන්ජලෝ (.....)

22. ඇමරිකානු නිදහස් සටන,
    1. ක්‍රි.ව. 1756 සත් අවුරුදු යුද්ධයෙන් පසු ඉංග්‍රීසි ජනපදවල තිබූ ප්‍රංශ තර්ජන ඉවත් වීම.
    2. ටවුන්සෙන්ඩ් පනත ක්‍රියාත්මක කිරීම.
    3. බොස්ටන් තේ සාදය ඇතිවීම.
    4. ක්‍රි.ව. 1786 දී ඇමරිකානු නිදහස් සටන ක්‍රියාත්මක කිරීම.
    5. ක්‍රි.ව. 1776 දී ඇමරිකානු ස්වාධීනතා පනත ක්‍රියාත්මක කිරීම. (.....)

23. 1848 දී විප්ලව ඇතිවූ රටවල්,
    1. ප්‍රංශය 2. ඉතාලිය 3. ජර්මනිය 4. ඔස්ට්‍රියාව 5. රුසියාව (.....)

24. ඉතාලි එක්සත් ව්‍යාපාරයේ අවස්ථා,
    1. පීඩ්මොන්ට් - සාර්ඩිනියා රාජ්‍යය නායකත්වය ගැනීම.
    2. 1850 දී මැසිනි පීඩ්මොන්ට් සාර්ඩිනියා රාජ්‍යයේ ප්‍රධාන ඇමති බවට පත්වීම.
    3. 1859 දී ඔස්ට්‍රියානු - සාර්ඩිනියානු යුද්ධය.
    4. ගැරිබෝල්ඩි විසින් දකුණු ඉතාලිය නිදහස් කරගනු ලැබීම.
    5. 1870 දී ඉතාලි එක්සත්භාවය සාක්ෂාත් කර ගැනීම. (.....)

25. ජාතික රාජ්‍යයක ප්‍රධාන අංග,

1. ශක්තිමත් ස්ථාවර හමුදාව    2. දුර්වල රාජාණ්ඩුව
3. ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව    4. නිශ්චිත දේශ සීමා
5. ජාතික එක්සත් බව (.....)

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C), හා (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද
B හා C පමණක් නිවැරදිනම් අංක 2 ද
C හා D පමණක් නිවැරදිනම් අංක 3 ද
A හා C පමණක් නිවැරදිනම් අංක 4 ද

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් අංක 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. පහත දැක්වෙන්නන් අතරින් රෝම අධිරාජ්‍ය පාලනය හා සම්බන්ධ ප්‍රධාන අවධි මොනවා ද ?

A) අධිරාජ්‍ය පාලනය - ටාර්ක්වින්
B) පරිපාලනය - යුරිපිඩීස්
C) අධිරාජ්‍ය පාලනය - ඔක්ටේවියන්
D) සමූහාණ්ඩුවාදී පාලනය - සීසර් (.....)

27. පහත සඳහන් හේතු අතරින් තිස් අවුරුදු යුද්ධයට සම්බන්ධ හේතු මොනවා ද ?

A) ඔග්ස්බර්ග් සංගමයේ පැවති දුර්වලතා
B) ක්‍රිස්තු සභාව සතු ඉඩම් පිළිබඳ ප්‍රශ්නය
C) රෙපරමාදු භක්තිකයන් විසින් ප්‍රොතෙස්තන්ත වාදීන් මර්ධනය කිරීම
D) ක්‍රි.ව. 1608 දී ප්‍රොතෙස්තන්තවාදී යූනියන් පිහිටුවීම (.....)

28. පහත දැක්වෙන්නන් අතරින් ප්‍රංශ විප්ලවයේ නායකයෝ කවරහු ද ?

A) කැලෝන්    B) මිරාබෝ    C) අබේසියස්    D) ටැලිරැන්ඩ් (.....)

29. පහත දැක්වෙන්නන් අතුරෙන් පසුකාලීන මධ්‍යතන යුගයේ ජීවත්වූ ඉතාලි ලේඛකයෝ කවරහු ද ?

A) ඩාන්ටේ    B) පෙට්රාක්    C) බොකැෂියෝ    D) බොටිචෙලි (.....)

30. පහත දැක්වෙන කරුණු අතුරෙන් ආගමික ප්‍රතිසංස්කරණය ඇතිවීමට තුඩුදුන් සාධක කවරේ ද ?

A) ක්‍රිස්තියානි ආගමික සභාවේ දූෂණ    B) පුණ්‍යඵල විකිණීම සම්බන්ධයෙන් ඇතිවූ මත භේදය
C) ක්‍රිස්තියානි මිෂනාරි ව්‍යාපාරයේ ආරම්භය    D) ඔග්ස්බර්ග් සාම සමථයේ තීරණ (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. බොස්ටන් තේ සාදය ඇති වූ වර්ෂය කුමක් ද ?

1. 1763 ජූනි 26    2. 1773 දෙසැම්බර් 16    3. 1789 ජූලි 14
4. 1743 නොවැම්බර් 01    5. 1453 දෙසැම්බර් 12 (.....)

32. අවසාන වශයෙන් නැපෝලියන් බොනපාට් පරාජයට පත් වූ සටන කුමක් ද ?

1. ට්‍රැෆල්ගා සටන    2. වෝටර්ලූ සටන    3. විලාෆැන්කා සටන
4. නයිල් සටන    5. උල්ම් සටන (.....)

33. එංගලන්ත පාර්ලිමේන්තුවේ පියා ලෙස හඳුන්වන්නේ කවු ද ?

1. දෙවන එඩ්වඩ් 2. පළමු එඩ්වඩ් 3. III වන හෙන්රි
4. VII වන හෙන්රි 5. IV වන හෙන්රි (.....)

34. එංගලන්තය තුළ කාර්මික විප්ලවය ඇතිවීමට බලපෑ හේතුව මොනවා ද ?

1. එංගලන්තය තුළ පැවති වැඩවසම් ක්‍රමය
2. ප්‍රංශ විප්ලවයේ බලපෑම් එංගලන්තයට පැමිණීම
3. යටත් විජිතවලින් අමුද්‍රව්‍ය පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම
4. විශාල රටක් වීම
5. සමාජවාදය පැතිරයාම (.....)

35. 1513 දී පැනමා දේශ සන්ධියට පැමිණි ගවේශකයා කවු ද ?

1. වස්කෝද බැල්බෝවා 2. ජොයිලට් 3. ජෝන් කැබෝ
4. වස්කෝද ගාමා 5. බර්තොලමියු දියෙස් (.....)

- **අංක 36 - 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි. දැක්වෙන 1,2,3,4,5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |
| | | |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. වැඩවසම් සමාජයේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ බලය විමධ්‍යගත වූ පාලන ක්‍රමයයි. | 1453 තුර්කීන් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම තිස් අවුරුදු යුද්ධයට තුඩු දුන් ප්‍රධාන හේතුවක් විය. (.....) |
| 37. පාර්ලිමේන්තුවේ සහය ඇතිව 8වෙනි හෙන්රි රජු එංගලන්තයේ රෙපරමාදු ව්‍යාපාරය මෙහෙය විය. | 1689 අයිතිවාසිකම් පිළිබඳ පනත මඟින් රජුගේ බලය අභිබවා පාර්ලිමේන්තුව උත්තරීතර තත්වයට පත් කරනු ලැබීය. (.....) |
| 38. ප්‍රංශයේ 16 වෙනි ලුවී රජු එංගලන්තයේ I එලිසබත් රැජින විවාහ කර ගැනීම නිසා රටවල් දෙක එක්සත් විය. | නැපෝලියන් බොනපාට්ගේ පාලන සමයේ ප්‍රංශයේ පළාත් පාලන නිලධාරීන් ''ප්‍රිපෙක්ට්ස්'' නමින් හැඳින්වුණි. (.....) |
| 39. පර්සියානුවන්ට එරෙහිව කරන ලද ග්‍රීක යුද්ධ පදනම් කරගෙන හෝමර් සිය වීර කාව්‍ය රචනා කළේය. | රෝම රාජ්‍ය තාන්ත්‍රිකයක වූ සිසරෝ කුමාරයා නම් ග්‍රන්ථයේ කතුවරයාය. (.....) |
| 40. 15 සහ 16 වැනි සියවස්වල සිදුවූ දේශගවේෂණ සහ විදේශ ජයග්‍රහණ හේතු කොට ගෙන බටහිර යුරෝපයේ ආර්ථික වර්ධන රටාව සහ සමාජය වෙනස් විය. | විදේශීය යටත් විජිත අධිරාජ්‍යය ඇතිකර ගැනීමට තුඩුදුන් දේශගවේෂණ, වානිජ කටයුතුවල සහ මුදල් සැපයුමේ වර්ධනයක් ඇති කරමින් බටහිර යුරෝපයේ වාණිජ ධනවාදය ඉදිරියට ගෙන ගියේය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25B | S | II

පළමු වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019
First Term Test - Grade 13 - 2019

විභාග අංකය .............................

# යුරෝපා ඉතිහාසය II

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
  (පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ සිතියමක් සපයා ඇත.)

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) පෝ නදිය (ii) ඇල්ප්ස් කඳු (iii) බිස්කේ බොක්ක (iv) පෝලන්තය (v) සිසිලිය
(vi) හංගේරියාව (vii) අසොව් මුහුද (viii) මැන්චෙස්ටර් (ix) බ්‍රසල්ස් (x) පෘතුගාලය
(xi) පැරිස් (xii) ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි) (ල. 12)

## B කොටස

02. ''යුරෝපා ශිෂ්ටාචාරය ගොඩනැඟීමෙහිලා බලපෑ ප්‍රබල සාධක අතර, ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලද පදනම සුවිශේෂී වේ.''

(i) ග්‍රීක ශිෂ්ටාචාරය තුළ පැවති අධ්‍යාපන ආයතන 2ක් නම් කරන්න. (ල. 2)
(ii) ඔලිම්පික් ක්‍රීඩාව හා ග්‍රීක ශිෂ්ටාචාරය අතර පවතින සබඳතාවය පැහැදිලි කරන්න. (ල. 3)
(iii) ග්‍රීක ශිෂ්ටාචාරය තුළ පැවති පාලන ක්‍රමය පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 11)

03. ''පුනරුදය යනු මධ්‍යතන යුරෝපය නූතන යුරෝපය බවට පරිවර්තනය කළ ප්‍රධාන සාධකයයි.''

(i) පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න (ල. 1)
(ii) පුනරුදය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි අර්ථ දක්වන්න. (ල. 2)
(iii) පුනරුදය ඇතිවීමට තුඩු දුන් සාධක කවරේ ද ? (ල. 5)
(iv) පුනරුදයේ ලක්ෂණ ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න. (ල. 8)

04. ''ප්‍රංශ විප්ලවය ආරම්භ කරන ලද්දේ මධ්‍යම පන්තිය විසිනි.''

(i) ප්‍රංශ විප්ලවය ඇතිවීමට ආසන්නතම හේතුව කුමක් ද ? (ල. 2)

(ii) පූර්ව විප්ලවීය ප්‍රංශයේ පැවති ප්‍රජා ගණ තුන නම් කරන්න. (ල. 3)

(iii) පූර්ව විප්ලවීය ප්‍රංශයේ ජීවත් වූ දාර්ශනිකයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)

(iv) ප්‍රංශ විප්ලවය ඇතිවීමට තුඩුදුන් හේතු කෙරෙහි අවධානය යොමු කරමින් විප්ලවය ආරම්භ කිරීමෙහිලා මධ්‍යම පන්තිය විසින් ඉටුකරන ලද කාර්යභාරය විවේචනාත්මකව විමසන්න. (ල. 8)

05. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) වෙස්ට්පේලියා සාම ගිවිසුම

(ii) වැඩවසම් ක්‍රමය බිඳවැටීමට බලපෑ හේතු

(iii) ඇමරිකන් නිදහස් සටන ඇතිවීමට බලපෑ හේතු

(iv) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල

(එක් කෙටි සටහනකට ලකුණු 08 බැගිනි)

## C කොටස

06. (i) නැපෝලියන් බොනපාට් අනුගමනය කළ දේශීය ප්‍රතිපත්තිය පරීක්ෂා කරන්න. (ල. 16)

07. ''යුරෝපය යළි ගොඩනගා සාමය උදාකරදීමට 1815 වියානා සමථය සමත් වීය.''

(i) වියානා සමුළුවට සහභාගි වූ නායකයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)

(ii) වියානා සමුළුව කැඳවීමට බලපෑ හේතු මොනවා ද ? (ල. 3)

(iii) සමුළුව විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති මොනවා ද? (ල. 10)

08. (i) ඉතාලිය එක්සේසත් කිරීමට තිබූ ප්‍රධාන බාධක කවරේ ද ? (ල. 6)

(ii) එම බාධක ජය ගනිමින් ඉතාලිය එක්සේසත් කළ ආකාරය පරීක්ෂා කරන්න. (ල. 10)

09. පහත දැක්වෙන මාතෘකා වල ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) නැපෝලියන්ගේ පරිහානිය

(ii) ලිබරල්වාදි හා ජාතිකවාදි චින්තනවල වර්ධනය (එක් කෙටි සටහනකට ලකුණු 8 බැගිනි)

## පළමු වාර පරීක්ෂණය 2019 - යුරෝපා ඉතිහාසය
## පිළිතුරු 13 - ශ්‍රේණිය
## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **01. -** | 1 | **11. -** | 5 | **21. -** | 4 | **31. -** | 2 |
| **02. -** | 2 | **12. -** | 1 | **22. -** | 4 | **32. -** | 2 |
| **03. -** | 5 | **13. -** | 3 | **23. -** | 5 | **33. -** | 2 |
| **04. -** | 2 | **14. -** | 5 | **24. -** | 2 | **34. -** | 3 |
| **05. -** | 4 | **15. -** | 3 | **25. -** | 2 | **35. -** | 1 |
| **06. -** | 3 | **16. -** | 3 | **26. -** | 4 | **36. -** | 1 |
| **07. -** | 4 | **17. -** | 4 | **27. -** | 5 | **37. -** | 2 |
| **08. -** | 5 | **18. -** | 2 | **28. -** | 2 | **38. -** | 4 |
| **09. -** | 3 | **19. -** | 4 | **29. -** | 5 | **39. -** | 3 |
| **10. -** | 4 | **20. -** | 1 | **30. -** | 1 | **40. -** | 5 |

## II කොටස

01.




**B කොටස**

02. (i) * ප්ලේටෝගේ ඇකඩමිය * ඇරිස්ටෝටල්ගේ ලයිසියම් (ල. 2)

(ii) * සියුස් දෙවියන් මුල් කරගත් බව * සියලුම පෞර රාජ්‍යවලින් සහභාගි වූ බව

* මැරතන් ඉසව්ව * ක්‍රීඩා ඉසව් දක්වන්න. (ල. 3)

(iii) * පෞර රාජ්‍යවල පැවති ආණ්ඩුක්‍රම විස්තර විය යුතුය.
* රාජාණ්ඩුව, ප්‍රභූ තන්ත්‍රය, කතිපයාධිපති, ආණ්ඩුව, ප්‍රජා පීඩක පාලනය, ප්‍රජාතන්ත්‍රවාදය විස්තර කරන්න. (ල. 11)

03. (i) * ඉතාලිය
(ii) * පැරණි ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල ආර්ථික, සමාජීය, දේශපාලනික, සංස්කෘතික ලක්ෂණවල නැවත පිබිදීමකි. (ල. 2)
(iii) * වෙළඳාමේ දියුණුව හා ධනවත් වෙළඳ පන්තියේ අනුග්‍රහය ලැබීම. * ඉතාලිය තුළ වැඩවසම් ක්‍රමය පිරිහීම.
* දේශ ගවේෂණවල යෙදීම. * තුර්කීන් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම. (ල. 5)
(iv) * භාෂාව, කලාව හා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ප්‍රබෝධය * ග්‍රීක ලතින් භාෂාවල වර්ධනය
* මානව වාදය * ලෞකිකත්වයට නැඹුරු වූ කලාව
* චිත්‍ර, මූර්ති, කැටයම් කලාව
ඉහත සඳහන් ලක්ෂණ නිසා පුනරුද අවධිශ්‍රේණි මධ්‍යතන යුගය නූතන යුගය බවට පරිවර්තනය වූ අයුරු දක්වන්න.(ල. 8)

04. (i) මූල්‍ය අර්බුදය හෙවත් ආර්ථික දුර්වලත්වය, භාණ්ඩාගාරය බංකොලොත් වීම, ස්ටේට්ස් ජෙනරාල් සභාව කැඳවීම නිසා ඇති වූ අර්බුදකාරී තත්වය (ල. 2)
(ii) රදලයන්, පූජකයන්, සාමාන්‍ය වැසියන් (ල. 3)
(iii) වෝල්ටෙයාර්, රූසෝ, මොන්ටෙසුක්‍යු (ල. 3)
(iv) * 18 වන විටත් ප්‍රංශ මධ්‍යම පන්තියේ දියුණුවට එරෙහි වූ බාධක රැසක් පැවතුණි.
* ප්‍රංශයේ සියලු ආර්ථික කටයුතු මෙහෙයවන ලද්දේ රජය විසින් රදලයන්ගේ අවශ්‍යතාවලටය.
* ආර්ථික ප්‍රතිපත්ති සකස් කලේද රදලයන්ය.
* ආණ්ඩුවේ හමුදාවේ හා ආගමික සභාවේ ඉහළ නිලතල දරණ ලද්දේ රදලයන් විසිනි.
* මේ නිසා ප්‍රංශ මධ්‍යම පන්තියට දේශපාලන ආර්ථික වැදගත්කමක් නොවීය.
* වෙළඳාමට හා ආර්ථික කටයුතුවලට බාධාකාරී ලෙස වැඩවසම් නීතිරීති ක්‍රියාත්මක විය.
* මෙම කරුණු උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 8)

05. ප්‍රමාණවත් කරුණු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 8 x 2)

06. * ස්වකීය බල තහවුරුවන අන්දමේ ආණ්ඩුක්‍රමයේ පිහිටුවා ගැනීම හා ජනමත විචාරණය මගින් තම ක්‍රියාමාර්ගවලට ජනතා කැමැත්ත ලබා ගැනීම.
* පරිපාලන ඒකාබද්ධතාවක් ඇති කිරීම, පළාත් පාලනය විධිමත් කිරීම හා ඒ සඳහා ප්‍රිෆෙක්ට්වරු පත් කිරීම.
* සාධාරණ බදු ක්‍රමයක් හා හැකියාවට හා දක්ෂතාවයට අනුව තනතුරුවලට පත්කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
* පාප් වහන්සේ සමඟ එකඟතාවයක් ඇතිකරගෙන කතෝලික සභාව හා රජය අතර පැවති ගැටුම සමථයට පත් කිරීම.
* නැපෝලියානු නීති සංග්‍රහය ක්‍රියාත්මක කිරීම.
* ලයිසීස් හෙවත් උසස් පාඨශාලා හා ගුරුවරුන් පුහුණු කිරීමට පැරීසියේ පාසලක් පිහිටුවීම.
* පැරීසියේ ජාතික විශ්ව විද්‍යාලයක් පිහිටුවීම.
* ප්‍රංශය ශක්තිමත් කිරීමට ආධාරවන මූල්‍ය හා ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම. (ල. 16)

07. (i) කාසල්රී, මෙටර්නික්, ඇලෙක්සැන්ඩර් සාර්, ෆෙඩ්රික් විලියම්, චාල්ස් ටැලිරූන් (ල. 3)
(ii) * යුරෝපයේ යුද්ධ අවසන් කොට සාමය ස්ථාපිත කිරීම.
* උදාකරගත් සාමය ආරක්ෂා කර ගැනීම. * ප්‍රංශය නැවත බලවත්වීම වැලැක්වීම.
* නැපෝලියන්ගේ ප්‍රතිපත්ති හේතුවෙන් අවුල් වී ගිය යුරෝපා සිතියම යථා තත්ත්වයට පත් කිරීම. (ල. 3)
(iii) * ප්‍රංශය තුල පැරණි රාජාණ්ඩුව ස්ථාපිත කිරීම.
* ප්‍රංශය 1792 වන විට පැවති දේශ සීමාවලට සීමා කිරීම.
* ප්‍රශියාවට බලවත් කිරීම. * නොර්වේ ස්වීඩන් ඒකාබද්ධ කිරීම.
* ස්විස්ර්ලන්තය නිදහස් ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීම. * ප්‍රංශය වටා බාධක රාජ්‍ය ගොඩනැඟීම.
* ෆින්ලන්තය රුසියාවට පැවරීම. * ප්‍රංශයට දඬුවම් නියම කිරීම.
* මෙම කරුණු උදාහරණ සහිතව විස්තර කළ යුතුය. (ල. 10)

08. (i) * ස්වාධීන රාජ්‍ය ගණනාවකට බෙදී පැවතීම
* ඉතාලි ප්‍රදේශ බොහෝමයක් විදේශ පාලකයන් හා ආධිපත්‍ය යටතේ පැවතීම
* ඉතාලිය තුළ බල පැවැත්වූ ඔස්ට්‍රියානු ආධිපත්‍යය * වියානා සමථයේ තීරණ
* පාප් වහන්සේගෙන් එල්ල වූ විරෝධය
* ප්‍රමාණවත් අන්දමින් ජාතිකත්වයක් හා ජාතිකානුරාගයක් ඉස්මතු වී නොතිබීම.
* ඉතාලිය එක්සත් කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක් ඉදිරිපත් නොවීම හා විවිධ පුද්ගලයන් හා ව්‍යාපාර, විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
* බලවත් මධ්‍යම පන්තියක් නොතිබීම. * ජනතාව අතර වූ භේදකාරී හැඟීම්. (ල. 6)
(ii) * 1848 ඉතාලි ප්‍රදේශවල විප්ලව ඇතිවීම.
* පීඩ්මන්ට් - සාඩිනියා රාජ්‍යය ඉතාලි එක්සත් ව්‍යාපාරයේ නායකත්වය ගැනීම.
* කැවුවර්ගේ ක්‍රියාකලාපය * පීඩ්මන්ට් සාර්ඩිනියා රාජ්‍යය ශක්තිමත් කිරීම.
* එහි හමුදා බලය වර්ධනය කිරීම. * ප්‍රංශ ආධාර ලබා ගැනීම සඳහා පියවර ගැනීම.
* 1859 ඔස්ට්‍රියාව හා සාර්ඩිනියාව අතර යුද්ධය.
* ලොම්බාර්ඩිය හා මධ්‍යම ඉතාලි රාජ්‍ය පීඩ්මන්ට් - සාර්ඩිනියා රාජ්‍යයට ඈදා ගැනීම.
* ගැරිබෝල්ඩි දකුණු ඉතාලිය ආක්‍රමණය කිරීම. * 1866 දී වෙනිෂියාව ඈදා ගැනීම.
* 1870 දී රෝමය ඈදාගෙන ඉතාලිය එක්සත් කිරීමේ කාර්ය අවසන් කරනු ලැබීම. (ල. 10)

09. ප්‍රමාණවත් තොරතුරු සඳහා ලකුණු ලබා දෙන්න. (ල. 8 x 2 =16)